ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2110/4 – 2019 පෙබරවාරි 11 වැනි සඳුදා – 2019.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

05 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, වැලිකඩමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ජීඑ/ඒටීටී/2017/475 හා 2018.01.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – සපුගස්ඕවිට – **ප්‍රමාණය:** හෙක් 4.1828 ක් පමණ

උතුරට: කේ. කේ. අනිල් සුරවීර හිමිකම් කියන පුංචි නාමලේ, ඇළ, හිමිකම් කියන අය සහ නම සොයාගත නොහැකි ඉඩම, බී. සේනාරත්න සහ තවත් අය හිමිකම් කියන අගලදෙනිය, ඩී. එච්. සේනාරත්න හිමිකම් කියන අගලදෙනිය කැලේ, බී. බන්දුල හිමිකම් කියන අගලදෙනිය සහ පාර; නැගෙනහිරට: හිමිකම් කියන අය සහ නම සොයාගත නොහැකි ඉඩම, බී. සේනාරත්න සහ තවත් අය හිමිකම් කියන අගලදෙනිය, ඩී. එච්. සේනාරත්න හිමිකම් කියන අගලදෙනිය කැලේ, බී. බන්දුල හිමිකම් කියන අගලදෙනිය පාර, සී. ටී. සම්පත් හිමිකම් කියන තලගහවත්ත, ඩබ්. ජී. සරත් කුමාර හිමිකම් කියන තලගහවත්ත, ඒ. ඒ. රෝහන අධිකාරි හිමිකම් කියන තලගහවත්ත, එම්. නිමල් රණසිංහ හිමිකම් කියන තලගහවත්ත සහ ජේ. ප්‍රීතිලාල් හිමිකම් කියන තලගහවත්ත; දකුණට: මාර්ගය, ඇළ සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: කැබලි අක්ෂර බී (පාර), කුරුණෑගල වැව්ලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට සහ කැබලි අක්ෂර බී (පාර).

02. කැබලි අක්ෂර 'ඊ' – සපුගස්ඕවිට – **ප්‍රමාණය:** හෙක් 0.5490 ක් පමණ

උතුරට: කැබලි අක්ෂර ඩී සහ බී (පාර); නැගෙනහිරට: කැබලි අක්ෂර බී (පාර); දකුණට: කැබලි අක්ෂර බී (පාර) සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: කුරුණෑගල වැව්ලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට.

03. කැබලි අක්ෂර 'එෆ්' – සපුගස්ඕවිට – **ප්‍රමාණය:** හෙක් 0.1266 ක් පමණ

උතුරට: කැබලි අක්ෂර සී; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර බී (පාර).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/417.
2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 08